# චතාරික සමයේ දෙවන සතිය
# සඳුදා

## පළමුවන කියැවීම

දානියෙල් දිවැස්ප්‍රසාදිතුමන්ගේ පොතෙන් ගත් පාඨයෙකි.

දානියෙල් 9: 4-10

**අපි පව් කළෙමු. අයුතුකම් කළෙමු. දුෂ්ටකම් කළෙමු.**

අහෝ සමිඳාණන් වහන්ස, ඔබ වහන්සේ උත්තම වූ බියකරු වූ දෙවියන් වහන්සේය. ඔබට ප්‍රේම කොට ඔබේ ආඥා රක්ෂා කරන්නන්ට ඔබ කරුණා කරන සේක. ගිවිසුම රක්ෂා කරන සේක. දෙවියන් වහන්ස, අපි පව් කළෙමු. අයුතුකම් කළෙමු. දුෂ්ඨකම් කළෙමු. කැරලි ගැසීමු. ඔබේ ශික්ෂාවලින් ද විනිශ්චයවලින් ද ඉවත්ව ගියෙමු. ඔබ වහන්සේගේ නාමයෙන් අපේ රජවරුන්ටත් අපේ අධිපතීන්ටත්, රටවැසියන්ටත් කතා කළ ඔබේ සේවක දිවැසිවරුන්ට අපි ඇහුම් කන් නුදුන්නෙමු. අහෝ ස්වාමිනි! ධර්මිෂ්ඨකම ඇත්තේ ඔබට ය. එහෙත් අප හැමට ඇත්තේ මුහුණ පෙන්නන්න බැරිතරම් ලැජ්ජාව ය. ඒ ලැජ්ජාවට පත් වී සිටින්නේ ජුදාවේ ජනයා හා ජෙරුසලමේ පුරවැසියන් වන අපි හැම ය. ඔබට විරුද්ධව ද්‍රෝහිකම් කළ නිසා ඔබ විසින් පන්නා දමනු ලැබ අහල පහළ හා දුර බැහැර සියලු රටවල සිටින සකල ඉශ්‍රායෙල්වරුන් වන අපි හැම ය.

සමිඳාණන් වහන්ස, අප ඔබට විරුද්ධ ව පව් කර ඇති නිසා, අපට එනම් අපේ රජවරුන්ටත්, අපේ අධිපතීන්ටත්, අපේ පියවරුන්ටත් ඇත්තේ මුහුණ පෙන්වන්නට බැරි ලැජ්ජාවය. උන් වහන්සේට විරුද්ධව අපි කැරලි ගසා ඇති නමුත් අපේ දෙව් ස්වාමින් වහන්සේ දයාන්විත ය. ක්ෂමා

ගුණයෙන් යුක්ත ය. අපේ සමිඳාණන් වහන්සේට අපි කීකරු නොවීමු. උන් වහන්සේ සිය දිවැසිවරුන් ලවා අප ඉදිරියේ තැබූ උන් වහන්සේගේ උපදෙස් අනුව අපි නොහැසිරුණෙමු.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 79 : 8-9, 11, 13

පිළිතුර: සමිඳුනි, අපේ පාපවලට සරිලන ලෙස අපට දඬුවම් නොකළ මැනව.

ගීය:

අපේ පියවරුන්ගේ දුෂ්ඨ ක්‍රියා අපට විරුද්ධව සිහි නොකළ මැනව. ඔබේ මෘදු දයාව අප කෙරෙහි විගස පැමිණෙවුව මැනව. අපේ බලාපොරොත්තු සියල්ල සුන් වී ඇත.

අපේ මිදුම්කාර දෙවිඳුනි, ඔබේ මහිමාන්විත නාමය නිසා අපට සරණ වුව මැනව. ඔබේ නාමය උදෙසා අප මුදා අපට කමා කළ මැනව.

ඔබේ සිරකරුවන්ගේ කත් කෙඳිරිය ඔබ ඉදිරියට පැමිණේවා!
මරණයට නියම වූ අය ඔබේ මහිමයෙන් ආරක්‍ෂා වෙත්වා!
එවිට ඔබේ තණබිමේ බැටළුවෝ ද ඔබේ සෙනඟ ද වන අපි සදහට ම ඔබට ස්තුති කරන්නෙමු. පරපුරෙන් පරපුරට අපි ඔබට පැසසුම් කරන්නෙමු.

## සාධුකාරය

ජීවනය දෙන්නේ ආත්මය වේ. මාංශයෙන් කිසි ප්‍රයෝජනයක් නැත. මා ඔබට වදාළ වචන ආත්මය ද ජීවනය ද වෙයි.

## සුවිශේෂය

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ලූක් **6 : 36 – 38**

***සමාව දෙන්න. එවිට ඔබට ද සමාව දෙනු ලැබේ.***

"ඔබේ පියාණන් වහන්සේ දයානුකම්පා ඇතිව සිටින්නාක් මෙන් ම ඔබ ද දයානුකම්පා ඇතිව සිටින්න. අනුන් විනිශ්චය නොකරන්න. එවිට ඔබත් විනිශ්චය කරනු නොලැබේ. සමාව දෙන්න. එවිට ඔබට ද සමාව දෙනු ලැබේ. අනුන්ට දෙන්න. එවිට ඔබටත් දෙනු ලැබේ. ඔව්හු නියම මිම්ම පිරී ඉතිරී යන තරමට එය සොලව සොලවා, තල තලා ඔබගේ ඔඩොක්කුවට මැන දමන්නහු ය. ඔබ යම් මිම්මකින් මැන දෙන්නහු ද ඒ මිම්මෙන් ම ඔබටත් ආපසු මැන දෙනු ලැබේ ය"යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේ ය.